සියවන ජන්ම දින අනුස්මරණය

# සිරිමාවෝ
# බණ්ඩාරනායක



ඡන්දයෙන් තෝරා පත් කරගත් ලංකාවේ මෙන් ම ලොව බිහි වූ ප්‍රථම අගමැතිනිය



6654

# සිරිමාවෝට තිබුණේ තමන්ගේම හැකියාවන් මත ගොඩනගාගත් නායකත්වයකි



1960 ජුලි 21 දින සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලංකාවේ (ශ්‍රී ලංකාවේ) ප්‍රථම අගමැතිනිය වූවාය. දේශපාලනයට නවකයකු වුවද, වැඩි කල් යන්නට පෙර ඇය තමන් දැරූ ධුරය තම පෞද්ගලිකත්වය මගින් ශෝභාමත් කළාය. එපමණක් නොව ශ්‍රී ලංකාවේ ප්‍රධාන විධායක වන අතරම විදේශ කටයුතු ක්ෂේත්‍රයෙන් ද වැදගත් භූමිකාවක ආරම්භය සනිටුහන් කළාය. නොබැඳි ව්‍යාපාරයේ කීර්තිමත් නායිකාවක වූ ඇය, 1960 සහ 1970 දශකයන්හි තුන්වන ලෝකයේ එක්සත්කම ප්‍රවර්ධනය කිරීමට ලබාදුන් දායකත්වය සහ සාමය හා ස්ථාවරත්වය සඳහා නොබැඳි ව්‍යාපාරය තුළ සහ ඉන් පිටත කළ මැදිහත්වීම් සිත්ගන්නා සුළුය.

තම ජිවිත ගමන් මග තුළ දෙවන වරටත් අග්‍රාමාත්‍ය ධුරය ලැබූ ඇය, 1976 අගෝස්තු 16 - 19 දිනවල පස්වන නොබැඳි නායක සමුළුව කොළඹදී පැවැත්වීම සඳහා සත්කාරක මෙහෙවර ඉටු කළාය. 1962 වර්ෂයේදී කුමන්ත්‍රණයකින් බලය ඇල්ලීමට උත්සාහ කළ අවස්ථාව සහ 1971 අප්‍රේල් මස පැවති තරුණ සහභාගිත්වයෙන් යුත් කැරැල්ලේ දී පැවති අභියෝගයන් අභියස නායිකාවක් වශයෙන් ඇය සතු හැකියාව පැහැදිලි විය. වතුකරයේ සේවය කළ ඉන්දියානු සම්භවයෙන් යුත් දමිළ ජාතිකයන්ගේ පුරවැසිභාවය පිළිබඳව අත්සන් කරන ලද සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම ආශ්‍රිතව පවත්වන ලද 1964 ඔක්තෝබර් 30 දින නිම වූ සාර්ථක සාකච්ඡාවන්හිදී ද, 1974 ජුනි 23 දින කච්චතිවු දූපත සඳහා ශ්‍රී ලංකාවේ අයිතිය තහවුරු කළ සිදුවීම් මාලාව ද, ඇයගේ රාජ්‍යතාන්ත්‍රික කුසලතා ගෙනහැර දැක්වීය. අන්තර්ජාතික පොහොර සැපයුම් යෝජනා ක්‍රමය නිර්මාණය කිරීමට ඇයගෙන් ලැබුණ දායකත්වය නිමිති කොට ගෙන ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ සෙරේස් රන් පදක්කම 1977 මැයි 12 දින ඇයට පිරිනමන ලදී.

අසාධාරණ දේශපාලන පීඩනයකට පත් කරමින් 1980 ඔක්තෝබර් 16 දින ඇයගේ පුරවැසි අයිතිවාසිකම් අහිමි කොට 1986 ජනවාරි 01 දින නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. පුරවැසිභාවය අහිමි වූ කාලය තුළ ද, ඇය ශ්‍රී ලංකාවට ලෙන්ගතුව අනලස්ව සේවය කළාය. ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ලෙස ඇයගේ බාල දියණිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග පත්වීමෙන් පසු 1994 නොවැම්බර් 14 දින ඇය තුන්වන වරටත් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය පදවිය ලැබුවාය.

# ආරම්භක අවධිය

මහනුවර බාන්ස් රත්වත්තේ දිසාව සහ මහවෙලතැන්නේ වලව්වේ රොසලින්ඩ් මහවෙලතැන්නේ කුමාරිහාමිගේ වැඩිමහල් දියණිය ලෙස 1916 අප්‍රේල් 17 දින ඇය උපත ලැබුවාය. බාන්ස් (කණිෂ්ඨ), පැට්‍රිෂියා, මැකී, සීවලී සහ ක්ලිෆඩ් ඇයගේ සහෝදර සහෝදරියන් වූහ. රටේ මහත්තයා තනතුර දැරූවකු හැටියට එවකට පැවති ආණ්ඩුකරණයෙහි සිරිමාවෝගේ පියාට හිමි වූ භූමිකාව අනුව ඔහු ක්‍රියාශීලී ජීවිතයක් ගත කළේය. ඇයගේ මව ස්වාමිදූවක් හැටියට හිමිවන කාර්යභාරයට අමතරව, ගරු සේවයක් ලෙස ආයුර්වේද වෛද්‍යවරියක් වශයෙන් තම සේවය අපේක්ෂා කළ අයට ස්වේච්ඡාවෙන් ප්‍රතිකාර කිරීමෙහිලා දැක්වූ කුසලතාව ගැන ප්‍රසිද්ධියක් ඉසුඹුවාය. සිරිමාවෝ තම ළමා වියෙහි මුල් අවධියෙන් වැඩි කොටසක් මහවෙලතැන්නේ සහ බලංගොඩ ගත කළ අතර, අනතුරුව රත්නපුර ෆර්ගියුසන් පාසලෙහි ද, අවසාන වශයෙන් කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයෙහි ද, අධ්‍යාපනය ලැබුවාය. ඇය පවුලේ බාල සොහොයුරු සොහොයුරියන් රැක බලා ගැනීමට උදව් කළාය. ඇයගේ පියාගේ ඇතැම් රාජකාරි කටයුතුවලට ද ඇය සහාය වූවාය. එබැවින් තම ජීවිතයේ මුල් අවධියේ සිට ම සිරිමාවෝ වගකීම් දැරීමටත්, නායිකාවක මෙන් හැසිරීමටත් හුරු වූ බවද, මෙසේ ජීවිතයේ මුල් කාලයේ සිටම නායකත්ව පුහුණුවක් ලැබීම, පසු කලෙක භාර්යාවක් ලෙස, මවක් ලෙස, තරුණ විය හොඳක්ම වූ වැන්දඹුවක් ලෙස සහ අගමැතිනිය ලෙස වගකීම් දැරීමට සිදු වූ කාලයේ දී ඇයට පිහිට විය



දෙමාපියන් සහ නැගණිය පැට්‍රිෂියා සමග බලංගොඩ දී



විවාහය - 1940 ඔක්තෝබර් 03

# යොවුන් විය සහ විවාහය

හොරගොල්ලේ මහමුදලි තැන්පත් ශ්‍රීමත් සොලමන් ඩයස් බණ්ඩාරනායක සහ ඩේසි (ඔබේසේකර) බණ්ඩාරනායක යුවළගේ පුත් සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක සමග 1940 ඔක්තෝබර් 03 දින සිරිමාවෝ විවාපත් වූවාය. එවකට තරුණ බණ්ඩාරනායක ලංකා යටත් විජිතයෙහි රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සෞඛ්‍යය සහ පළාත් පාලන විෂයභාර ඇමති වශයෙන් සාර්ථක දේශපාලඥයකු ලෙස ස්ථාපිතව සිටියේය. විවාහයෙන් කෙටි කලකට පසු, එම යුවළ තම යුග දිවියේ ප්‍රථම නිවස වූ, කොළඹ 07, ගිල්ෆර්ඩ් ක්‍රෙසන්ට් හි වෙන්ඩ්වර්ත් නිවසේ පදිංචි වූ අතර ඉන්පසු රෝස්මීඩ් පෙදෙසේ ටින්ටජල් නිවසේ පදිංචියට ගියහ. බණ්ඩාරනායක මහතාගේ අකල් මරණය හේතුවෙන් වෙන්වනතුරු ම ඔවුහු එහි පදිංචිව සිටියහ.




දරුවන් සුනේත්‍රා, චන්ද්‍රිකා සහ අනුර සමඟ

# සිරිමාවෝගේ යොවුන් විය

විවාහයෙන් පසු සිරිමාවෝ, ප්‍රජාව තුළ වඩා පුළුල් භූමිකාවකට ඉඩ සැලසූ ක්‍රියාකාරකම්වල ඉතා උද්යෝගයෙන් නිමග්න වූවාය. වෛද්‍ය මේරි රත්නම් විසින් 1930 දී පිහිටුවන ලද, ග්‍රාමීය දිළිඳු ජනයාගේ ජීවන තත්වය නගා සිටුවීමට කැප වූ කාන්තා සංවිධානයක්ව පැවති ලංකා මහිලා සමිතියට ඇය 1941 දී බැඳුනාය. 1940 ගණන්වලදී එම සංවිධානය වර්ධනය වී තම නිම්වලලු පුළුල් කර ගත්තේය. එම වකවානුව වන විට එම සංවිධානයේ ග්‍රාමීය සංවර්ධනයේ සියලු පැතිකඩවලට සම්බන්ධ වෙමින් සෞඛ්‍යය, සනීපාරක්ෂාව, ව්‍යවසායකත්වය, ගෘහ කර්මාන්ත සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් ඇතුළු එනමුත් ඒවාට සීමා නොවූ විෂය පථයක් ආවරණය කළේය. මහිලා සමිති ව්‍යාපාරය තුළ සහ එම ව්‍යාපාරය මගින් කරනු ලැබූ සේවය උදෙසා බස්නාහිර, උතුරු මැද සහ සබරගමුව පළාත්වල ඈත එපිට ග්‍රාමීය ප්‍රත්‍යන්තවලට ගමන් කිරීමට ඇයට සිදුවිය. විවිධ සමාජ - සංස්කෘතික පසුබිම්වලට අයත් තම සුහද පුරවැසියන්, ඔවුන්ගේ එදිනෙදා ජීවිතය පිළිබඳව නොවැදගත් සේ පෙනෙන විස්තරාත්මක ප්‍රවෘත්ති පවා බණ්ඩාරනායක මැතිනියට ලබාදුන්හ. එම ප්‍රවෘත්තිවලට ඔවුන්ගේ ජීවිත ගැටගසා ගැනීම සඳහා දැරූ ප්‍රයත්නයේ දී මුහුණ පෑ දිළිඳුකමේ රුදුරු බව ගැන ද සඳහන් විය. මෙකල ලබාගත් අත්දැකීම් සහ අන්තර්ඥානය පසු කලක මහජන සේවය සහ වඩා බැරෑරුම් සේවාවන්ට ඇය කැඳවුම් ලැබූ අවධියේ දී ඇයට ප්‍රයෝජනවත් විය. සිරිමාවෝ අවුරුදු 20කට ආසන්න කාලයක් ලංකා මහිලා සමිතියේ සාමාජිකාවක් වී සිටියාය. ලංකා මහිලා සමිතිය තුළ ඇය භාණ්ඩාගාරික තනතුරෙන් උපසභාපති තනතුරට ද, අනතුරුව සභාපති තනතුරට ද පත් වී 1960 දී අග්‍රාමාත්‍ය තනතුර ලබන තුරු එම තනතුර දැරුවාය. තවද, ක්‍රිස්තියානි ආගම ඇදහූ පවුලක් සමග විවාහයෙන් සම්බන්ධ වුව ද, විපස්සනා භාවනා සමිතියට දිගටම උදව් උපකාර කළාය.

ශ්‍රී ලංකා සමාජයේ කාන්තාවන්ට පැවරුන සම්ප්‍රදායික කාර්යභාරය විශේෂයෙන් ම 1940 සහ 1950 ගණන්වලදී කෙබඳු වුව ද, තම සැමියාගේ සෙවනැල්ලෙහි කාලය ගත කළ කාලයෙහි සිරිමාවෝ තම සැමියාට බුද්ධිමත්, විවිධ නිපුණතාවන්ගෙන් පොහොසත් සහකාරියක් වූ බව අවධාරණයෙන් යුක්තව සිහිපත් කළ යුතුය. ඇය ජීවත් වූ කාලයේ සමාජ පිළිගැනීමට ලක් වූවාට වඩා වැඩි නිපුණතා රැසක් ඇය සතුවිය. එම යුගයේ දී නිවසින් පරිබාහිර සමාජ පසුබිමෙහි කාන්තාවකට ඉටු කළ හැකි මෙහෙවර ගැන තිබුණේ අල්ප වූත් එසේත් නැත්නම් ප්‍රමාණවත් නොවූ හඳුනා ගැනීමක් හෝ පිළිගැනීමක් බවත් මතක තබාගත යුතුය.


දියණිය චන්ද්‍රිකාගේ හිස පීරීම


අනුර පුතාට කථාවක් කියවීම


ආහාර වේලක් පිසීමට උදව් කිරීම



දරුවන් තිදෙනා සමග

# භාර්යාවක් සහ මවක්

සිරිමාවෝ සහ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායකට ළමුන් තිදෙනෙක් විය. වැඩිමහල් දියණිය සුනේත්‍රා 1943 ජුලි 27 දින උපත ලැබූ අතර, බාල දියණිය චන්ද්‍රිකා 1945 ජුලි 29 දින උපත ලැබුවාය. පුතු අනුර 1949 පෙබරවාරි 15 මෙලොව එළිය දුටුවේය.

අගමැති එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ ඝාතනයෙන් තරුණ බණ්ඩාරනායක පවුලට උදාවූයේ මහත් අභාග්‍යයකි. බණ්ඩාරනායක මහතාගේ ටින්ටජෙල් නිවසේදී බෞද්ධ භික්ෂුවකට දණ නමා වඳින විට, එම භික්ෂුව විසින් ඉතා සමීප දුරක සිට බණ්ඩාරනායක මහතාට වෙඩි තබන ලදී. 1959 සැප්තැම්බර් 26 දින, ඉකුත් දිනයේ වෙඩි පහර ලැබ සිදුවුන තුවාල නිසා, අගමැතිතුමා මරණයට පත් විය. ඔහු අගමැති තනතුර ලබා අවුරුදු තුනක් ඉක්ම යන්නට පෙර සිදු වූ මරණය නිසා මුළු රටම දේශපාලන අර්බුදයකට සහ අවුලකට පාත්‍ර විය. අවිවාදයෙන් පිළිගත් නායකයකු අහිමි වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙහි විශාල හිඩැසක් ඇති විය.

මෙහි ප්‍රතිඵලය නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ව්‍යාකූලත්වයට පත්වී බෙදී වෙන්වන තත්ත්වයට පත්වීමයි. තම ජනකාන්ත නායකයා ඝාතනය වීමෙන් හිස් වූ නායකත්වයට බොහෝ අපේක්ෂකයන් හිමිකම් කියා පෑම නිසා පක්ෂය දෙදරුම් කෑවේය. ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් අතර පැවති වෘත්තීය ප්‍රතිවිරෝධතා සහ පෞද්ගලිකත්වය හා බැඳුන ගැටුම් නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකඩ වීමේ තර්ජනකයට මුහුණ පෑවේය. පක්ෂයේ බලවතුන් බණ්ඩාරනායක දර්ශනය සහ මෙහෙවර ආරක්ෂා කිරීම සහ ඉදිරියට ගෙනයාම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය භාර ගැනීමට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කැමති කරවා ගැනීමට උත්සාහ කළේ මෙම සන්දර්භය තුළ ය. දීර්ඝ ලෙස අදහස් විමසා බලා, සැක මුසු හැඟීමෙන් යුක්තව, හිස්තැන පිරවීමට සිරිමාවෝ තීරණය කළාය.


ඇයගේ ස්වාමියා සමග

# ලංකාවේ මෙන් ම ලෝකයේ ද ඡන්දයෙන් තෝරාගත් ප්‍රථම අගමැතිවරිය



1960 දී අගමැතිනිය ලෙස කාර්යාලයට පැමිණි පළමු දිනය

1960 ජුලි 21 දින සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලංකාවේ මෙන් ම ලෝකයේ අන් කවර රටක වුව ද බිහි වූ ප්‍රථම අගමැතිවරිය වූවාය. අගමැති පදවිය ලැබූ පළමු අවස්ථාවේ සිට පස් වසරක් ඉකුත් වීමට පෙර බණ්ඩාරනායක කෙනෙක් නැවත වරක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීරණාත්මක දේශපාලන ජයග්‍රහණය කරා මෙහෙය වූවේය. එස්.ඩබ්.ආර්.ඩී. ජයග්‍රහණය කළ අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමාන අදහස් ඇති පක්ෂ රාශියක එකතුවක ප්‍රධාන පක්ෂය විය. පාර්ලිමේන්තුවේ ඉතා සුළු ආසන සංඛ්‍යාවන් හිමි පක්ෂවල ආධාරය මත රැඳීම අවශ්‍ය නොවන පරිදි ව්‍යවස්ථාදායකයෙහි වැඩි ආසන සංඛ්‍යාවක් ලබා ගනිමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැහැදිලි ජයග්‍රහණයක් කරා මෙහෙය වීමෙන් සිරිමාවෝ වඩාත් සුවිශේෂී වූ කාර්යය සාධනයක් අත්පත් කර දුන්නාය. මාස කීපයකට පෙර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අනාගතය ගැන බලාපොරොත්තු තැබිය නොහැකි අවලංගු කාසියක් බවට පත්වී තිබුණි.

කෙසේ වුව ද, සිරිමාවෝගේ ඓතිහාසික ජයග්‍රහනය සම්බන්ධ දේශපාලන සහ ව්‍යවස්ථාමය සංකීර්ණතා තිබුණි. ලංකා අගමැති එවකට (1960) පැවති ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයෙහි, එනම් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙහි (පහළ මන්ත්‍රී මණ්ඩලය) හෝ සෙනෙට් සභාවෙහි (ඉහළ මන්ත්‍රී මණ්ඩලය) සාමාජිකයෙකු විය යුතු විය. එබැවින් නව අගමැතිතුමියට මාස තුනක් ඇතුළත නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙහි හෝ සෙනෙට් සභාවෙහි මන්ත්‍රීවරියක් වීම අවශ්‍ය විය. එම්.පී.ද සොයිසා මහතා ඉල්ලා අස්වීම නිසා සිරිමාවෝ මැතිනියට 1960 අගෝස්තු 05 දින සෙනේට් සභාවේ සාමාජිකාවක් හැටියට දිවුරුම් දීමට අවස්ථාව උදාවිය.

එකොළොස්වන පොදුරාජ්‍ය මණ්ඩලීය අග්‍රාමාත්‍ය සමුළුවට සහභාගී වීම පිණිස 1961 මාර්තු 17 දින එක්සත් රාජධානියේ ලන්ඩනය බලා යාම බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය ලෙස සහභාගී වූ ප්‍රථම නිල ගමන වේ. එම වර්ෂයේ ම සැප්තැම්බර් පළමු සතියේදී ඇය යුගෝස්ලෝවියාවේ බෙල්ග්‍රේඩ්හි පැවති ප්‍රථම නොබැඳි නායක සමුළුවට සහභාගී වූවාය. පිටරට යාමට සිදු වූ මෙම අග්‍රාමාත්‍ය නිල ගමන් ඇයට වඩාත් නිස්කලංකව නිරත වීමට හැකි වූ රාජකාරී වන්නට ඇත. වැඩිකල් නොයා දී ඇයට සංකීර්ණ රාජ්‍ය පාලන ගැටළුවලට මුහුණ පෑමට සිදුවිය. එම ගැටළු අතර වඩාත් සුවිශේෂ වනුයේ 1962 ජනවාරි 27 දින දියත් කළ අසාර්ථක රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයයි. වාසනාවකට මෙන් නීත්‍යානුකූලව ඡන්දයෙන් තෝරා පත්වුන රජය පෙරලීමට දැරූ ප්‍රයත්නය අසාර්ථක විය. එපමණක් නොව කුමන්ත්‍රණය විසින් රජය අස්ථාවර කරනවා වෙනුවට වක්‍රාකාරව වඩාත් ශක්තිමත් කරන ලදී. රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයේ දීර්ඝ කාලීන ප්‍රතිඵලය වූයේ 1956ට පසුව ප්‍රථම වරට ඇති වූ ජාතික ඉරිතැලීම් - එනම් භාෂාමය සහ ආගමික ඉරිතැලීම් - තවදුරටත් ගැඹුරු වීමයි. රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයට සහභාගී වූ වැඩි දෙනෙක් සමාජයේ බටහිරකරණයට පත් කොටස්වලට අයත් කතෝලිකයන් සහ වෙනත් ක්‍රිස්තියානි ආගමිකයන් වීම රජය විවෘත ලෙස සිංහල - බෞද්ධ අන්තවාදීන්ට සහාය වීම සාධාරණීකරණය කළේය. 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයේ අහිතකර ප්‍රතිඵලයක් නම්, යුධ හමුදාව සහ පොලීසිය ජනවර්ගීකරණයට භාජන වීමත්, එහි ප්‍රබලතාවයේ ප්‍රමාණයට 1970 දශකය සහ ඉන් පසු ජනවාර්ගික සබඳතා කළමනාකරණය අපහසු වීමත් ය. අගමැතිනියට මුහුණ පෑමට සිදු වූ අනෙක් වැදගත් ප්‍රශ්නය නම් කැබිනට් මණ්ඩලය තුළ ඇතිවූ බෙදීමය. මතවාදී කරුණු මත ජ්‍යෙෂ්ඨ ඇමතිවරු බෙදී සිටියහ. වමට බර වූ ඇමතිවරු ආර්ථිකය සහ අධ්‍යාපනය පිළිබඳ ඉහළ රාජ්‍ය පාලනයකට පක්ෂ වූ අතර, දක්ෂිණාංශයට බර වූ ඇමතිවරු එබඳු රාජ්‍ය පාලනයකට අකමැති වූ අතර, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ වාමාංශික බලය වැඩි වීම ගැන බිය පල කළහ.



දළදා මාලිගාවේ දී



ඇයගේ ප්‍රථම කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු

මෙරට අනාගතය සහ රජය කෙරෙහි අහිතකර වූ සහ කල්පවතින ප්‍රතිඵල ගෙනදුන් ප්‍රතිපත්ති තීරණ දෙකක් නම් පාසල් සහ ගුරු පුහුණු පාසල් රජය සතු කිරීම සහ 1962 අසාර්ථක රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයෙන් පසු යුධ හමුදාව සහ පොලීසිය ජනවර්ගීකරණයට භාජන කිරීම ය. අප සමාජයේ සිංහල අබෞද්ධ කොට්ඨාසය අවාසි සහගත තත්ත්වයකට පත් කිරීමට රජය අපේක්ෂා කළත් නොකළත් පාසල් රජයට පවරා ගැනීම සහ යුධ හමුදාවෙහි සහ පොලීසියෙහි බෞද්ධයන්ට වැඩි සැළකිල්ලක් දැක්වීම [illegible] ප්‍රතිඵලය නම් බහුත්වවාදී සමාජයක සාර්ථකත්වයට අත්‍යවශ්‍ය අංගයක් වන ඇතුලත් කර ගැනීමේ පිළිවෙතට රජය අකමැති බවට සංජානනයක් ඇති වීමයි. මෙම හේතුව නිසා සිංහල බෞද්ධ නොවන ජනතාවගේ හැඟීම් පළුදු විය. (1970 ගණන්වල මුල් භාගයේ දී මාධ්‍ය පදනම් කරගත් ප්‍රමිතිකරණය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා දිස්ත්‍රික් කෝටා ක්‍රමය හඳුන්වා දීම නිසා එම පළුදු වීම් තවදුරටත් තීව්‍ර විය).

සිරිමාවෝ බණ්ඩාරනායක 1963 පසුභාග යේදී දිවයිනේ විදේශිකයන් සතු තෙල් සමාගම් රජය සතු කිරීම සඳහා නීති සම්මත කළාය. මෙරට පෙට්‍රෝලියම් නිෂ්පාදනය ආනයනය සහ බෙදාහැරීම සම්පූර්ණයෙන් ම ලංකා ඛනිජ තෙල් සංස්ථාවට පවරන ලදී. ඊළඟ වසරේදී ඇය දකුණු අප්‍රිකාව ඇපාතීඩ් පාලනයෙන් නිදහස් කර ගැනීම සඳහා නෙල්සන් මැන්ඩෙලා මෙහෙය වූ අරගලයට සහාය පල කළාය.


ඇතැම් පුවත්පත් රජයට පවරා ගැනීම සඳහා වූ පනත පාර්ලිමේන්තුවේ දී පරාජයට පත් වූ බැවින් 1964 දෙසැම්බර් 03 වන දින පාර්ලිමේන්තුව විසිරුවා හරින ලදී. එක්සත් ජාතික පක්ෂයට ඒ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කළකිරීමට පත්ව සිටි දක්ෂිණාංශයේ සහාය ලැබුණි. මේ අනුව සිරිමා බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය වශයෙන් සේවය කළ පළමු නිල කාලය අවසන් විය.




1964 ඔක්තෝබර් 30 දින සිරිමා - ශාස්ත්‍රී ගිවිසුමට අත්සන් තැබීම



ඇයගේ මුදල් ඇමතිගේ [illegible]ඛනය කියවීමට සවන් දීම





[illegible]



නොබැඳි ව්‍යාපාරයේ නායිකාව ලෙස 1976 දී
එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ඇමතීම



එක්සත් අරාබි ජනරජයේ ජනාධිපති ගමෙල් අබ්දෙල් නසාර් සමග




චීන මහජන සමූහාණ්ඩුවේ අග්‍රාමාත්‍ය චෞ එන් ලායි සමග



පලස්තීන විමුක්ති සංවිධානයේ නායක යසර් අර්පත් සමග



සැම්බියාවේ ජනපති කෙනත් කවුන්ඩා සමග



බ්‍රිතාන්‍ය අගමැති හැරල්ඩ් විල්සන් සමග



ඉන්දියාවේ අගමැති ජවහර්ලාල් නේරු සහ ඔහුගේ දියණිය ඉන්දිරා සමග



දෙවන එලිසබෙත් මහරැජින සහ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල නායකයන් සමග



චීන මහජන සමූහාණ්ඩුවේ සභාපති මාවෝ සේතුං සමග



ඉන්දියාවේ අගමැති ඉන්දිරා ගාන්ධි සමග



පකිස්තානයේ අගමැති සුල්ෆිකාර් අලි බුට්ටෝ සමග



කැනඩාවේ අගමැති පියරේ ට්‍රූඩෝ සමග


ඉන්දියාවේ ජනාධිපති සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් සහ අගමැති ජවහර්ලාල් නේරු සමග





එක්සත් සෝවියට් සමාජවාදී ජනරජයේ නායක නිකිටා කෘෂෙව් සමග

# විරුද්ධ පක්ෂයේ නායිකාව සහ අගමැතිනිය ලෙස කටයුතු කළ දෙවන නිල කාලය




එක්සත් පෙරමුණු රජයේ කැබිනට් මණ්ඩලය - 1970

අගමැතිනිය හැටියට සිරිමාවෝ කටයුතු කළ ප්‍රථම නිල කාලය, ඇතැම් විට රජය තුළ මෙන් ම ඉන් පිටත ද සිටි අන්තවාදී ජාතිවාදීන්ගේ පෙළඹවීම නිසා සිංහල දෙමළ සබඳතා අයහපත් ලෙස කළමනාකරණය කිරීම හේතු කොට ගෙන එම සබඳතා අසතුටුදායක තත්ත්වයට පත් වූවා පමණක් නොව, 1965 සිට 1970 දක්වා විරුද්ධ පක්ෂයේ නායිකාව ලෙස ගතකළ කාලය තුළ වුව ද, එම කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනසක් සිදු වූයේ නැත. 1956 සිට ශ්‍රී ලංකා දේශපාලනයෙහි අවාසනාවන්ත බලපෑම වූ ජනවාර්ගික අභිබවනය හෙවත් එකිනෙකා අභිබවා සිංහල ජනවර්ගයට වැඩි වාසි සලසන ප්‍රතිපත්තිය සාමාන්‍ය ප්‍රතිපත්තියක් හැටියට අනුගමනය කරන ලදී. අගමැතිනිය හැටියට තම ප්‍රථම නිල කාලයේ දී, බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම යනුවෙන් හඳුන්වනු ලැබූ ඇයගේ ස්වාමියා ෆෙඩරල් පක්ෂය සමග අත්සන කළ ගිවිසුමෙහි යෝග්‍ය වෙනස්කම් කොට සිංහල - දෙමළ දේශපාලන වෙනස්කම් සමතයකට පත් කිරීමට කටයුතු කරන බවට ෆෙඩරල් පක්ෂයට දුන් සහතිකය අනුව කටයුතු කිරීමට සිරිමාවෝට නොහැකි විය. ෆෙඩරල් පක්ෂයේ සැක සංකා දුරු කරන බවට එම පක්ෂයට පොරොන්දුවක් දී තිබියදී මෙරට දෙමළ කථා කරන ප්‍රදේශවල ද, නීතිමය තීරණ සිංහල භාෂාවෙන් ප්‍රකාශයට පත් කිරීමට ඉඩ සලසන උසාවිවල භාවිතා වන භාෂාව පිළිබඳ 1959 දෙසැම්බර් පනත සිරිමාවෝගේ නව රජය විසින් නීතිගත කරන ලදී. තවද, 1961 ජනවාරි 01 දින සිට දිවයින පුරා පරිපාලනය සඳහා වන එකම භාෂාව සිංහල බවට පත්කිරීම ද ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව, එක්සත් ජාතික පක්ෂයේ නව රජය, (එවකට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ඇතිව පැවති ජාතික රජයේ කොටස්කරුවකු වූ) ෆෙඩරල් පක්ෂය සමග එකඟතාවයක් ඇතිව 1958 දී අත්සන් කළ බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම අනුව, භාෂාව පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට 1966 දී උත්සාහ කළ විට, එම ප්‍රතිපාදන බණ්ඩාරනායක ප්‍රතිපත්තිවලට අනුරූප නොවන බව ප්‍රකාශ කරමින් සිරිමාවෝ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එයට විරුද්ධ විය. විරුද්ධ වුවත් අතර විරුද්ධ පක්ෂයේ සිටි සිරිමාවෝගේ වාමාංශික මිත්‍ර පාක්ෂිකයෝ ද වූහ. මෙසේ විරුද්ධ වීමෙන් සදාතනික අවමානය වැළඳගත් වාමාංශික පක්ෂ අතර ප්‍රමුඛස්ථානය, ලංකා සමසමාජ පක්ෂයට හිමි වේ. තවද ලංකා කොමියුනිස්ට් පක්ෂය ද විරුද්ධ වූ කාණ්ඩයේ විය. එතෙක් ප්‍රතිපත්තිමය පදනමක් මත සිංගල හා දෙමළ භාෂාවන්ට සම තැන් හිමි විය යුතුය යන මතයෙහි පිහිටි නමුත්, එම අවස්ථාවේදී ජනවාර්ගික අභිබවන ක්‍රීඩාවෙහි යෙදී සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග ලංකා සම සමාජ පක්ෂය සහ ලංකා කොමියුනිස්ට් පක්ෂය එකතු විය. මෙම දේශපාලන ක්‍රීඩාව, 1957 දිස්ත්‍රික් සභා පනත ආදර්ශ කොට ගෙන කෙටුම්පත් කළ, 1969 දිස්ත්‍රික් සභා පනත වැර්ථ කිරීමට ද හේතු පාදක විය. මෙම බාධකය සමග ජාතික රජයෙන් ෆෙඩරල් පක්ෂය ඉල්ලා අස්වීම, දෙමළ - සිංගල සබඳතා වඩාත් ගැඹුරු වූ ඉරිතැලීමකට භාජන කළේය.

## 1970 සහ ඉන් පසු

උත්කර්ෂවත් ජයග්‍රහනයකින් පසු නැවත බලයට පැමිණි සිරිමාවෝ 1970 මැයි 29 දින අගමැතිනිය හැටියට දෙවන වරටත් දිවුරුම් දුන්නාය. ලංකා සමසමාජ පක්ෂය සහ ලංකා කොමියුනිස්ට් පක්ෂය සමග සන්ධානගත වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් පෙරමුණ නමින් තරඟ වැදී, මහජන ඡන්දයේදී විරුද්ධවාදීන් අතුගා දමා පෙර නොවූ විරූ පරිදි පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක වැඩි ඡන්දයක් ලබා ගත්තේය. නිදහස ලබා ගැනීමෙන් පසු එවැනි බහුතරයක් ලැබූ එකම දේශපාලන එකතුව එක්සත් පෙරමුණ විය. අගමැතිනිය හා ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමතිනිය වීමට අමතරව සිරිමාවෝ ක්‍රමසම්පාදන හා සේවා නියුක්තිය පිළිබඳ ඇමතිනිය ද වූවාය. මෙය සිරිමාවෝගේ දේශපාලන බලයේ උච්ච අවස්ථාව විය.

දෙවන නිල කාලය මුලදී වැදගත් අමුත්තන් කීපදෙනෙක් ම පිළිගැනීමට සිරිමාවෝට සිදුවිය. එම අමුත්තන් අතර සිංගප්පූරුවේ අගමැති ලී ක්වාන් යූ, සය වන පාවුලු පාප් වහන්සේ සහ කැනේඩියානු අගමැති පියරේ ට්‍රූඩෝ විය. නොබැඳි ව්‍යාපාරයේ බලකණුවක් වූ ද, සිරිමාවෝගේ සමීප මිතුරෙකු වූ ද, ගමෙල් අබ්දෙල් නසාර් 1970 සැප්තැම්බර් 29 දින අභාවප්‍රාප්ත විය. මේ හේතුව නිසා ඇයට මසක් ඇතුළත අප්‍රිකාවට



පළමු ජනරජ ව්‍යවස්ථාව අනුමත කළ දිනයේ පාර්ලිමේන්තුවේ දී - 1972

දෙවන වරටත් යාමට සිදුවිය. ඇය බොහෝ අමුත්තන් සහභාගී වූ කයිරෝහි පැවති අවමංගල උත්සවයට සහභාගී වූවාය. එම මාසයේ ම මුල් කාලයේදී සැම්බියාවේ ලුසාකා හි පැවති නොබැඳි ව්‍යාපාරයේ නායක සමුළුවට ඇය සහභාගි වූවාය. මෙම සමුළුවේ විශේෂ සිදුවීමක් නම් ඉන්දියානු සාගරය සාම කලාපයක් කිරීමට සිරිමාවෝ ඉදිරිපත් කළ යෝජනාවයි.

## 1971 අප්‍රේල් මස තරුණ කැරැල්ල

අගමැතිනිය හැටියට පත්වූ පළමු නිල කාලයේදී අවුරුදු දෙකක් පමණ වූ කාලයක් ගත වූ පසු අසාර්ථක රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයකට මුහුණ දුන් සිරිමාවෝට, ඇයගේ දෙවන නිල කාලයෙන් මාස 12ක් තරම් කෙටි කාලයක් ගත වූ කල, එතරම් ම අභියෝගාත්මක වූ රාජ්‍ය අර්බුදයකට මුහුණ පෑමට සිදුවිය. එම අභියෝගය එල්ල වූයේ ජනතා විමුක්ති පෙරමුණ සංවිධානය කොට ක්‍රියාත්මක කළ තරුණයන් නායකත්වය දුන් සන්නද්ධ කැරැල්ලක් නිසාය. ජනතා විමුක්ති පෙරමුණේ මෙම කැරලිකරුවන් තරුණ වියෙහි පසුවූ, අධ්‍යාපනය ලද නමුත් රැකියා විරහිතව හෝ අවාසි සහගත රැකියා නියුක්තිය ලැබූ, දිළිඳු, දිවයිනේ ග්‍රාමීය පෙදෙස්වලට අයත් වූවන් විය. කැරැල්ල පහසුවෙන් මැඩපැවැත්වීමට රජයට හැකි වුවත්, මෙම කැරැල්ල රජයේ දේශපාලන දිසානතිය කෙරෙහි ඉතා විශාල බලපෑමක් ඇති කළේය. එය දේශපාලන ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා වඩාත් වමට නැඹුරු ආරම්භයක් සනිටුහන් කළා පමණක් නොව, යුදමය වශයෙන් පරාජය වුවද, මෙරට අනාගතය හැඩගැස්වීමෙහි ලා කැරලිකරුවන්ගේ දර්ශනයෙහි බලපෑමට ඉඩ ලබා දුන්නේය. ශ්‍රී ලංකාව වඩා වේගයකින් සමාජවාදී සමාජයක් කරා තල්ලු කරන ලදී. මූලික සමාජ ආර්ථික වෙනස්කම් රාශියක් අතරින් වැඩි බලපෑම් ඇති කළේ 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය සහ 1974 - 75 කාලයේ වතු රජය සතු කිරීමයි. පෞද්ගලික අයිතිය සහිත ඉඩම් නැවත බෙදාදීම මගින් මෙරට ඉඩම් භුක්ති ව්‍යුහය වෙනස් කිරීමට දැරූ ප්‍රථම ප්‍රයත්නය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතයි. තරුණ කැරැල්ල මෙරට අශුභ ආරම්භයක් හැටියට සැලකිය හැකි හදිසි නීතිය යටතේ පාලනයට ද මග පෑදුවේය. 1971 කැරැල්ල ඇති කළ දේශපාලන අර්බුදය දැඩි ලෙස හා එලදායී ලෙස හසුරුවන අතර ම, එය ඉතා සංවේදී ලෙස ඉටු කිරීම වෙනුවෙන් සිරිමාවෝට ප්‍රසාදය හිමි වී ඇත. නොමග ගිය තරුණ විප්ලවවාදීන්ට ඇය අවබෝධයෙන් හා සංවේදීතාවයෙන් යුක්තව දැක්වූ ප්‍රතිචාරය, 1987 - 1989 කාලයේදී නැවත ඇති වුන ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීම මර්දනය කළ අනුකම්පා විරහිත ආකාරයට වඩා බෙහෙවින් වෙනස් ය. කෙසේ වුවද, දෙවන වර ජනතා විමුක්ති පෙරමුණ මුදා හල ප්‍රචණ්ඩත්වය ප්‍රථම අවස්ථාවට වඩා අත්‍යන්තයෙන් ම කුරිරු වූ බවද, භයානක වූ බව ද සටහන් කළ යුතුය.



vi වන පාවුළු පාප්වහන්සේ හමු වූ දිනය 1970



1994 නොවැම්බර් මස තුන්වන වරටත් අග්‍රාමාත්‍ය ලෙස පත්කරනු ලැබූ අවස්ථාවේ දී ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සමඟ


# සෙනෙට් සභාව අවලංගු කිරීම සහ ජනරජයක් බිහි කිරීම

1971 සැප්තැම්බර් 26 දින, සිරිමාවෝට 1960 දී පාර්ලිමේන්තු ප්‍රවේශය ලබාදුන් ඉහළ මන්ත්‍රීමණ්ඩලය වන සෙනෙට් සභාව අවලංගු කරන ලදී. මෙම අවලංගු කිරීම ශ්‍රී ලංකාව සඳහා ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීමේ පෙර නිමිත්තක් විය. 1972 මැයි 22 දින එවකට සෝල්බරි ව්‍යවස්ථාව වෙනුවට නව දේශපාලන ව්‍යවස්ථාවක් හඳුන්වා දීමත් සමග ලංකාව ශ්‍රී ලංකා ජනරජය බවට පත්විය. සෝල්බරි ව්‍යවස්ථාව අධිරාජ්‍යවාදී ආරෝපනයක් හැටියට වාමාංශික දේශපාලනඥයන් ද, වමට බර කණ්ඩායම් ද දිගු කලක පටන් හඳුන්වා තිබුණි.

සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන යෙදීමට ව්‍යවස්ථා සම්පාදකයන් අපොහොසත් වීම ගැන විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා 1971 ජුනි මාසයේදී ව්‍යවස්ථාදායක සභාවෙන් ෆෙඩරල් පක්‍ෂය ඉවත් වීමෙන් පැහැදිලි වන පරිදි, එම පක්‍ෂයේ කලකිරීම ක්‍රමයෙන් තීව්‍ර වීම, පළමු ජනරජ ව්‍යවස්ථාව ස්ථාපනය කිරීමේදී දක්නට ලැබුණ සුවිශේෂ ලක්‍ෂණයකි. ඉන් පසු සියළුම දමිළ දේශපාලන පක්‍ෂ ද්‍රවිඩ එක්සත් පෙරමුණ යනුවෙන් එක් පෙරමුණක් ලෙස සංවිධානය විය. එම සංවිධානය පසුව ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ බවට පත්විය. මේ අනුව ශ්‍රී ලංකාවේ ජාතික අසමගියේ තවත් අදියරක් උදාවිය. 1956 න් පසුව උදාවූ රොස් පරොස් බවෙන් පිරි ජනවාර්ගික බෙදීම, මේනයින් වඩා උත්සන්නව දිවයිනේ ප්‍රථම දේශපාලන ව්‍යවස්ථාව අරමුණු කරගත් ජාතිය ගොඩනැගීමේ ව්‍යායාමය ව්‍යාර්ථ කළේය. මෙම සිදුවීම් ශතවර්ෂයකින් හතරෙන් එකකට වැඩි කාලයක් තුළ ශ්‍රී ලංකාව විනාශ මුඛයට හෙළූ විනාශකාරී බෙදුම්වාදයේ ආරම්භක අවස්ථාව සනිටුහන් කරයි.



ලංකාවේ ආණ්ඩුකාර ධුරය දැරූ පසුව ශ්‍රී ලංකා ජනරජයේ අග්‍රාණ්ඩුකාර පදවියට පත් විලියම් ගොපල්ලව සමග



කොළඹ නිදහස් චතුරශ්‍රයේ දී පැවැත් වූ පළමු ජනරජ ව්‍යවස්ථාවෙහි සමාරම්භක උත්සවයට සහභාගී වූ [illegible]



බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම සඳහා පළමු පස් පිඩැල්ල කැපූ අවස්ථාවේ පැවති උත්සවයට සහභාගී වූ අවස්ථාව

# වෙනත් වැදගත් සිදුවීම්



1974 ඔක්තෝබර් 06 වන දින යාපනය විශ්වවිද්‍යාලය විවෘත කළ අවස්ථාවේ දී යාපනය පුරපති ඇල්ෆ්‍රඩ් දුරෙයප්පා සමග

**බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව**

චීන රජය විසින් ශ්‍රී ලංකා ජනතාවට ප්‍රදානය කරන ලද බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි සමාරම්භය 1973 මැයි 17 දින සිදුවිය. සමාරම්භක උත්සවයට සහභාගී වූ පිරිස අතර ආණ්ඩුකාර තැන්පත් විලියම් ගොපල්ලව, අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක, චීන රාජ්‍ය සභාවේ උප සභාපති මාෂල් සු චියෙන්, එවකට ලංකාවේ සිටි චීන තානාපති සහ චීනයේ සහ ශ්‍රී ලංකාවේ කම්කරුවන් නියෝජනය කරමින් කම්කරුවන් දෙදෙනෙක් ද වූහ.

**බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය**

අවුරුද්දකට පමණ පසුව, එනම් 1974 දෙසැම්බර් 09 දින, අන්තර්ජාතික සබඳතා, අන්තර්ජාතික නීතිය සහ රාජ්‍යතාන්ත්‍රික අධ්‍යයනයනට කැප වූ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ අධ්‍යයන අංශය වන බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.

**යාපනයේ විශ්වවිද්‍යාලය**

1974 ඔක්තෝබර් 06 වන දින අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක විසින් යාපනයේ විශ්වවිද්‍යාලය විවෘත කරන ලදී. එමගින් උතුරු පළාතට ලබාගැනීමට බොහෝ සුදුසුකම් තුබූ අධ්‍යාපන ආයතනයක් හිමි විය. එම ආයතනය එවක් පටන් වසරින් වසර ශක්තියෙන්, ප්‍රමාණයෙන් සහ බලපෑමෙන් වර්ධනය වී තිබේ.



# එක්සත් පෙරමුණ බිඳී යාම

එක්සත් පෙරමුණ සැදුම් ලත් ප්‍රධාන පක්‍ෂ දෙක වන ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය සහ ලංකා සමසමාජ පක්‍ෂය අතර පැවති තියුණු වෙනස්කම් එම පෙරමුණ දෙකඩ වීමේ තත්ත්වයට 1975 දී වර්ධනය විය. මෙම වෙනස්කම් අවසාන වශයෙන් එම වර්ෂයේදී ම ලංකා සමසමාජ පක්‍ෂය එක්සත් පෙරමුණෙන් නෙරපීමට හේතු විය. ඒ අනුව මෙම දේශපාලන පක්‍ෂ දෙක අතර 1964 දී ආරම්භ වූ දශකයකට වඩා පැරණි සහාගය අවසන් විය. කෙටි කාලයකට පසු කොමියුනිස්ට් පක්‍ෂය ද, කලකිරුණ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් කීප දෙනෙක් සමග සන්ධානයෙන් ඉවත් විය. එක්සත් පෙරමුණ බිඳවැටී අවුරුදු දෙකක් තරම් කෙටි කාලයක් ගත වන්නට මත්තෙන් ජේ.ආර්. ජයවර්ධනගේ උපායශීලී නායකත්වය ඇතිව ප්‍රතිජීවනය ලද එක්සත් ජාතික පක්‍ෂය විසින්, තමන් අබියසෙහි වූ සියළු බාධක බිඳ දමා 1977 ජුලි මස පැවති මහජන ඡන්දයේදී, ලංකා සමසමාජ පක්‍ෂය සහ පැරණි වාමාංශය මෙරට දේශපාලන සිතියමෙන් අතුගා දමන ලදී.

සිරිමාවෝ 1977 මැයි 18 දින පාර්ලිමේන්තුව විසුරුවා ඊළඟ මහජන ඡන්දය සඳහා 1977 ජුලි 21 දිනය නියම කළාය. ඇයගේ මාක්ස්වාදී සහායකයන් මෙන්ම ඇය ද, 1970 දී ලැබූ දැවැන්ත ජයග්‍රහනයෙන් වසර හතකට පසු, දේශපාලන බලය සහ කීර්තියෙහි අනිත්‍යතාවය සනාථ කරමින් අන්ත පරාජයකට පත් වූවාය.

**සිවිල් අයිතිවාසිකම් අහිමි කිරීම**

සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ව සිටි අවධියේදී තම බලය අනිසි ලෙස යොදාගත් බව පෙනෙන කරුණු ගැන පැවති චෝදනා විභාග කිරීමට, 1977 දී බලයට පත් නව රජය විසින් විශේෂ ජනාධිපති කොමිසමක් පත් කරන ලදී. ඇයගේ සහායක ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකට විරුද්ධව ද චෝදනා ඉදිරිපත් විය. 1980 අගෝස්තු 25 දින කොමිසමේ වාර්තාවෙහි පිටපතක් රහස්‍ය වාර්තාවක් ලෙස ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා වෙත භාරදෙන ලදී. සිරිමාවෝ බණ්ඩාරනායක සහ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක යන දෙදෙනාටම විරුද්ධව කොමිසම තීරණයක් ලබා දුන්නේය. සිරිමාවෝ බණ්ඩාරනායක සහ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක යන දෙදෙනාගේ ම සිවිල් අයිතිවාසිකම් අවුරුදු හතකට අහිමි කිරීමට ද, සිරිමාවෝට පාර්ලිමේන්තුවේ අසුන අහිමි කිරීමට ද රජය විසින් යෝජනාවක් 1980 ඔක්තෝබර් 16 දින සම්මත කර ගත්තේය. මෙම යෝජනාවට පක්‍ෂව ඡන්ද 139ක් ද, විරුද්ධව 19ක් ද ලැබුණි. ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයේ සහ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු විරුද්ධව ඡන්දය දුන්හ. සිරිමාවෝ බණ්ඩාරනායක ඡන්දය දීමෙන් වැළකී සිටියාය. ඇයගේ සිවිල් අයිතිවාසිකම් 1986 ජනවාරි 01 දින ප්‍රතිෂ්ඨාපනය කරන ලදී.



# යුගයක අවසානය



1988 දෙසැම්බර් 19 සහ 1989 පෙබරවාරි 15 දින පිළිවෙළින් පැවැත්වූ ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන ඡන්ද විමසීම් දෙකෙන් ම පරාජය වූ නමුත්, සිරිමාවෝ රටටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් කැපවීමෙන් යුක්තව තවදුරටත් සේවයෙහි නියුතු වූවාය. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනරජයෙහි ජනාධිපති හැටියට තේරී පත් වූ පසු 1994 නොවැම්බර් 14 දින තුන්වන වරටත් සිරිමාවෝ අග්‍රාමාත්‍ය ධුරයට පත්වූවාය.

මේ වන විට ඇයගේ සෞඛ්‍යය යහපත් තත්ත්වයක නොපැවති අතර, ඇය පෙර මෙන් උද්‍යෝගීමත් නොවූවාය. ඇය වයෝවෘද්ධභාවය ආශ්‍රිත සෞඛ්‍යය ගැටළු කරණ කොට ගෙන දුබල වුව ද, ඇයගේ පොදු ජන සේවාවන් නිර්භීතව හා ධෛර්යමත්ව ඉටු කළාය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙහි අභ්‍යන්තර ආරවුල් විසඳීමට සහාය වීම එම සේවාවන් අතර විශේෂ විය. ඇයගේ ජීවන චරිතය පුරාම නොවෙනස්ව දක්නට ලැබෙන, ඇත්ත වශයෙන්ම ජීවිතයේ අවසානය දක්වාම දක්නට ලැබෙන, කාරණයක් නම් තම පක්ෂයට ඇය දැක්වූ ලැදියාවයි. තම දේශපාලන ජීවිතයෙහි සියළු වෙනස්වීම් තුළ, එහි සියළු ජයග්‍රහන සහ පසුබෑම් තුළ, සිරිමාවෝ පක්ෂයට දැක්වූ ලැදියාව නොසෙල්වී පැවතුණි. 2000 ඔක්තෝබර් 10 වන දින එළඹි ඇයගේ ජීවිත අවසානය සිදු වුයේ, එම වසරේ පැවති මහජන ඡන්දයේදී නිට්ටඹුවේ සංඝබෝධි මහා විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානයට ගොස් තම පුරවැසි වගකීම ඉටුකරමින් ඡන්දය ප්‍රකාශ කොට ආපසු ගෙදර පැමිණෙන විටය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

REFERENCE

සිරිමාවෝ බණ්ඩාරනායක
අනුස්මරණ කමිටුව වෙනුවෙන්
**තිස්ස ජයතිලක** විසින් රචනා කරන ලදී.






පොළොන්නරුවේ උත්සවයක දී තරුණ මෛත්‍රීපාල සිරිසේන සමග




විජය කුමාරතුංග සමග දියණිය චන්ද්‍රිකා විවාහ වීම නිමිත්තෙන් පැවති උත්සවයේ දී



දියණියන් සුනේත්‍රා සහ චන්ද්‍රිකා සමග



දියණිය චන්ද්‍රිකා සහ මුනුපුරන් සමග



පුත් අනුර පිරිත් නූලක් බඳියි



සතුටින් සිටි අවස්ථාවක්

කොළඹ 2 හුණුපිටිය පරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2016 අප්‍රේල් මස 06 වැනිදා බදාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.